# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

**මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා විසින්
2011 ජුනි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 ජුනි මස 06 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[111 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

**මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, එකී සංගමයේ පරමාර්ථ සහ එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ මඩහපොල පිහිටුවා තිබූ හෙයින් ද :

මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම යන එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති බැවින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2011 අංක දරන මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන් වූ සියලු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයෝ ද මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු "මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ ශාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු

මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** මෙම සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම, බෞද්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, බෞද්ධයන්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනික, සංස්කෘතික සහ සාමාජයීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ආ) ඓතිහාසික යාපහුව ප්‍රදේශයේ බෞද්ධ භික්ෂූන් වහන්සේගේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංවර්ධනයක් තුළින් සමාජයේ ධාර්මික හා ආර්ථික අභිවෘද්ධිය ඇති කිරීම ;

(ඇ) ප්‍රදේශයේ සංඝ සමාජයේ අභිවෘද්ධිය සඳහා සංඝ මූලස්ථානවල, රාජ්‍ය ආයතනයන්හි, රාජ්‍ය නොවන සංවිධානයන්හි, දළදා මාලිගාවේ ශාසන සංවර්ධන අරමුදල, මල්වතු මහා විහාරයේ ශ්‍රී සිද්ධාර්ථ සරණංකර සුභසාධක පදනම, විදේශීය දූත මණ්ඩල යන ආයතනයන්ගේ උපදේශාත්මක හා මුල්‍යමය සහයෝගය යොමු කරවා ගැනීම ;

(ඈ) අරමුදලක් පිහිටුවා, එය සංස්ථාපිත කොට, දීර්ඝකාලීන ශාසනික සුභසාධක වැඩපිළිවෙළකට පදනම දැමීම ;

(ඉ) ශාසනික ක්‍රියාකාරකම්, නූතන සන්නිවේදන හැකියාවන් හා භාෂාන්තර ශාක්‍යතාව සංවර්ධනය කිරීමේ පහසුකම්වලින් සමන්විත, නේවාසික භික්ෂූන් වහන්සේ සිය නමකට පමණ පහසුකම් සහිත ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම ;

(ඊ) වාපී ශිෂ්ටාචාරය මත ගොඩනැගුණ ගිහි සමාජය තුළ ධාර්මික රැකියා මත පදනම් වූ ජීවන ක්‍රමයක් ගොඩනැංවීම සඳහා අදාළ ආයතනයන්හි අවධානය යොමු කරවීම ;

(උ) ගමෙන් පන්සලට යන සංකල්පය වෙනුවට පන්සලෙන් ගමට යන සංකල්පය මත ජනතාවට පන්සලෙන් සලසා දිය හැකි පහසුකම් සලසා දීම ;

(ඌ) නොමග යන තරුණ පිරිස සුමගට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම ;

(එ) රටට ව්‍යසනයක්ව පවතින මත් උවදුර දුරු කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීම ;

(ඒ) පන්සල් පරිශ්‍රයන් තුළ පෙරපාසල් ආරම්භ කිරීමට පෙළඹවීම සහ සිසුන් තුළ ආගමික ප්‍රබෝධය ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ; සහ

(ඔ) දහම් පාසල් ආරම්භ කර නොමැති විහාරස්ථානවල දහම් පාසල් ආරම්භ කිරීමට කටයුතු කිරීම.

**4.** සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ පවත්වා ගෙන යාම හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානය සහ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම, සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීම, සේවයේ යෙදවීම හා සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද, එකී දේවල් ක්‍රියාවේ යෙදවීමේ ද බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන්නා වූ ද, තැනැත්තන්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් විසින් සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරයන් දරන මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනමේ නිලධරයන්ට මෙම සංස්ථාවේ විධිවිධානවලට යටත්ව නිලධරයන් වශයෙන් කටයුතු කළ හැකි වන අතර, එම දිනයේ දී සාමාජිකයන් වූ පුද්ගලයෝ මෙම සංස්ථාවේ විධිවිධානවලට යටත්ව සාමාජිකයන් වෙති.

සංස්ථාව සංස්ථාගත කිරීමට පෙර සිටි නිලධරයන්ට තවදුරටත් ක්‍රියාකළ හැකි බව.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**7.** සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයයෙන් නෙරපීම සඳහා ද සංස්ථාවේ නියෝජිතයන් හෝ සේවකයන්ගේ පාලක මණ්ඩලයේ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ද, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන ආකාරයේ රීතීන් සංස්ථාව විසින් සාමාජිකයන්ගේ රැස්වීමක දී ඊට පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේය.

එවැනි රීති සෑදීමෙන් පසුව එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් එම රීතීන් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ සාමාජිකයන් රීතිවලට යටත් විය යුතු බව.

**8.** සංස්ථාවේ සාමාජිකයන් සැමවිටම සංස්ථාවේ රීතින්ට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත්, දැරීමටත් නීතියේ ලා බලය සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු ණය සහ පදනමට අයවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනමේ පවත්නා සියලු ම ණය හා සියලු ම බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම වෙත අයවිය යුතු සියලු ම ණය සහ එය වෙත ගෙවිය යුතු සියලු දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් සේවයෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් සේවයෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.*

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ එසේ කිරීමට පෙර හෝ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් එවැනි ආයතනයන් තීරණය කළ යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.